> “වනාන්තරය වූ කලී ස්වකීය පැවැත්ම සඳහා ඉල්ලීම් නොකරන්නාවූද, ජීව ක්‍රියාවලියේදී සිය නිෂ්පාදිතයන් පරිත්‍යාගශීලී ලෙස ප්‍රධානය කරන්නාවූද, අසීමිත දයානුකම්පාවකින් හා පරිත්‍යාගශීලී භාවයකින් යුතු අපූරු ජීවියෙකි. සකල ජීවීන්හට රක්ෂාවරණය සලසන්නා වූ එය පොරෝ පහරින් සිය විනාශය සලසන්නාහට පවා සෙවන දෙයි”
>
> ගෞතම බුදුරජාණන් වහන්සේ

# රටක් වටිනා ගසක්

ගහකින් අවුරුදු 50 ක් තුළදී ලබාදෙන ලද සේවය මෙසේ දක්වෙයි. ඔක්සිජන් නිෂ්පාදනයේ වටිනාකම රු: 2 ලක්ෂ පණස් දහකි. පරිසර දූෂණය පාලනය කිරිමෙ වටිනාකම රු: 5 ලක්ෂයකි. හෝද පාළුව මැඩීමේ හා පස සරු කිරීමෙ කාර්යයේ වටිනාකම රු: 2 ලක්ෂ පණස් දහකි. තෙතමනය රැඳවීමේ සහ වර්ෂා පතනයට ආධාරකාරි වීමේ වටිනාකම රු: 3 ලක්ෂයකි. පක්ෂීන් හා සතුන්ගේ රක්ෂිතයක් සේ සැලසූ සේවයේ වටිනාකම රු: 2 ලක්ෂ පණස් දහකි. මාංශජනක ධාතුන් පිළියෙල කිරීමේ සේවයේ වටිනාකම රුපියල් විසිදහකි. එම ගහෙන් ලැබුණු දැව සහ පලාවල වල වටිනාකම මෙම සේවා වටිනාකමට ඇතුළත් නොවිය. ‘පැළැටි සහ පරිසර දූෂණය’ යන මැයෙන් කල්කටා කෘෂිකර්ම විශ්ව විද්‍යාලයයේ මහාචාර්ය ටී. එම්. දස් මෙ ගණන් හිලවු ඉදිරිපත් කළේ බරණැසදී පවත්වන ලද ඉන්දීය විද්‍යාඥ මණ්ඩලයේ රැස්වීම වාරය කදිය.

මහාචාර්ය දස් ගේ නිගමනය අනුව සාමාන්‍ය ගසක ආයුෂ අවුරුදු 100 ත් 200 අතර වෙයි. අවුරුදු 400 ත් 500 ත් අතර වූ කාලයක් පවත්නා ගස්ද එතරම් දුර්ලභ නොවේ.

රත්හඳුන් ගසක සාමාන්‍ය ජීවන කාලය අවුරුදු 2000 පටන් 3000 දක්වා වෙයි. මේ විද්‍යාත්මක පර්යේෂණය සඳහා යොද ගන්නා ලද්දේ ගහක අවුරුදු 50 ක කාලය තුළදී සේවය පමණකි.

විශාල වශයෙන් වැඩුණු ගසක වාණිජමය වටිනාකම දුන් පවත්නා තත්වය අනුව රු: 5000 ක් වෙයි. එය එම ගසින් අවුරුදු 50 ක් තුළදී සිදුවූ සේවයේ වටිනාකමින් අංශු මාත්‍රයක් පමණි. එතරම වටිනා සේවයක් ඉටු කරණ ගසක් අද සමාජයේ ඉතා සුළු වාණිජමය වටිනාකමක් නිසා විනාශ කර දමෙයි.

සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන ජනගහණයේ අධිකකම නිසාත් ගසක ඇති නියම වටිනාකම නොදන්නා නිසාත් අද බොහෝ දෙනෙක් ගස් වැල් කපා විනාශකරති.

හොඳින් වැඩුණු ගසකින් නිෂ්පාදනය වන ඔක්සිජන් ප්‍රමාණය එක් අවුරුද්දකදී ටොන් එකකට මදක් වැඩි වුවද දළ වශයෙන් අද වෙළඳ පොළේ පවත්නා මිල ගණන් අනුව එම ඔක්සිජන් ටොන් එකක් රුපියල් 5000 ක් වෙයි. ඒ අනුව අවුරුදු 50 කදී එම ගසේ ඔක්සිජන් නිෂ්පාදනයේ වටිනාකම රුපියල් 2 ලක්ෂ පණස් දහකි.